# 3 ලොවින් බිඳක්



ආයුබෝවන්, ගුරුතුමී!
ආයුබෝවන්, ළමයිනේ!

"අද අපට තියෙන්නේ පුවත්පත් සිරස්තල හා පුවත්පත් දැන්වීම් කියවන්න නේ ද?" ගුරුතුමී ඇසුවා.

"ඔව්, ගුරුතුමී, අපට ඊයේ කීවා නේ ඒවා හොයාගෙන එන්න කියලා. අපි හොයාගෙන ආවා." නිමල් කීවා.

"මං ඔයාලට ඊයේ දුන්න අකුරු තියෙන ඒවා ද හොයා ගෙන ආවේ"

"ඔව්, ඔව්, ඒ අකුරු තියෙන ඒවා තමයි හොයාගෙන ආවේ"

"හොඳයි, ළමයි ගෙනා විස්තර පන්තියට ඇහෙන්න කියවමු." ගුරුතුමී යෝජනා කළා.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

“මම ගෙනා සිරස්තල කියවන්නම්.” රාණි ඉස්සර වුණා.


සරසවිවලින් දුරස්ථ අධ්‍යාපන
ඩිප්ලෝමා පාඨමාලා


ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
උපාධි ප්‍රදානෝත්සවයේ
ඡායාරූප ගැනීම


අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව
(වසර 03) - සිංහල /ඉංග්‍රීසි මාධ්‍ය

“ඊළඟට මම කියවන්නම්.” සීතා ඉදිරිපත් වුණා.

“සීතා ඔයා හොයා ගත්තේ මොනවා ද ?” ගුරුතුමී ඇසුවා.

“මමත් ගෙනාවේ පුවත්පත් සිරස්තල.” සීතා උත්තර දුන්නා.

“හොඳයි, හැමෝටම ඇහෙන්න කියවන්න.” ගුරුතුමී කීවා.


මීගොඩ ආර්ථික මධ්‍යස්ථානයේ ධීවර වෙළෙඳසල් 12 ක් අද ඇරේ


පේරාදෙණිය සරසවියේ පරිපූරක වෛද්‍ය සිසුන්ට වෙනම පීඨයක් ඕනෑ

"හොඳයි, හැමෝ ම තොරතුරු සොයා ගෙන ඇවිත් තියෙනවා. හැම දෙනා ම හොඳයි." ගුරුතුමී සතුටින් කීවා.

"හෙට අපි මේවා ගැන තව ටිකක් කතා කරමු."

"ආයුබෝවන් ළමයිනේ!"

"ආයුබෝවන් ගුරුතුමී!"

---

## ක්‍රියාකාරකම 1

(i) මෙහි ඇති පුවත්පත් සිරස්තල ශබ්ද නගා කියවන්න.

(ii) සීතා කියවූ පුවත්පත් සිරස්තල නිසි උච්චාරණයෙන් යුතුව කියවන්න.

(iii) ඉරු දින සිංහල පුවත්පතක පුවතක් සොයා ගෙනැවිත් හුවමාරු කර ගනිමින් කියවන්න.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

## ක්‍රියාකාරකම 2

දුරස්ථ, අධ්‍යාපන, පාඨමාලා, උපාධි, ඡායාරූප, මාධ්‍ය, සාකච්ඡාව, ආර්ථික, ධීවර

(i) පුවත්පත් සිරස්තලවල ඇති ඉහත සඳහන් වචන හඬ නගා කියවන්න.

(ii) එම වචන ඔබේ අභ්‍යාස පොතේ ලියන්න.

(iii) එම වචන යොදා වැකි පහක් ලියන්න.

## ක්‍රියාකාරකම 3

**පහත වචන ශබ්ද නගා කියවන්න.**












නොමිලේ බෙදා හැරීම සඳහා ය.

## ක්‍රියාකාරකම 4

පහත දැක්වෙන කොටු තුළ ඇති අකුරු ගළපා වචන ලියන්න.

උදාහරණ:-

| | | | | |
|---|---|---|---|---|
| | ස | | බ | |
| න් | | ම් | | ධ |

මෙය ගැළපූ විට සම්බන්ධ යන පදය සැකසේ.

(i)

| | | | |
|---|---|---|---|
| ශ්‍රා | | ය | |
| | ආ | | ණ |

(ii)

| | | |
|---|---|---|
| | යා | |
| ව | | ජා |

(iii)

| | | | |
|---|---|---|---|
| | ය | | ඨා |
| ස් | | න | |

(iv)

| | | |
|---|---|---|
| ය | | භූ |
| | මි | |



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

(v) පෘ වි ය ථි

(vi) ව ෂා භා

## ක්‍රියාකාරකම 5

වරහන් තුළ ඇති අකුරු යොදා වචන සම්පූර්ණ කර ශබ්ද නගා කියවන්න. පසුව ඒ වචන අභ්‍යාස පොතේ ලියන්න.

**( ඨා , ෂා, ථී, ධී, ඡේ, භී, ධා, භා, ථූ, භූ )**

(i) ස් වා ☐ න

(ii) සි ද් ☐ ර් ථ

(iii) ☐ ෂ ණ ය

(iv) කොට් ☐ ස ය

(v) ක ☐ ක යා

(vi) ☐ ෂා ව

(vii) ☐ ද ය



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

(viii) සා ක ච් ☐ ව

(ix) ☐ මි ය

(x) ☐ ප ය

## ක්‍රියාකාරකම 6

පහත දැක්වෙන්නේ දිනපතා පුවත්පතක පළ වූ පුවතකි. එය නිවැරදි උච්චාරණයෙන් යුතු ව ශබ්ද නගා පන්තිය ඉදිරියේ කියවන්න.

### ලෝක වෙළෙඳපොළේ ඛනිජ තෙල් මිල ඉහළ යයි.

ලෝක වෙළෙඳපොළේ තෙල් මිල තව දුරටත් ඉහළ නැග ඇති බව වාර්තා වෙයි.

පසුගිය මාසයේ සිට ලෝක වෙළෙඳපොළේ ඛනිජ තෙල් මිල වේගයෙන් ඉහළ ගිය අතර ඒ අනුව ශ්‍රී ලංකාවේ ද ඛනිජ තෙල් මිල ගණන් ඉහළ නංවනු ලැබී ය.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

## ක්‍රියාකාරකම 7

ඉහත 6 වැනි ක්‍රියාකාරකමෙහි සඳහන් ජේදය ඔබේ අභ්‍යාස පොතේ නිවැරදිව පිටපත් කර ලියන්න.

## ක්‍රියාකාරකම 8

වරහන් තුළ දී ඇති අකුරුවලින් සුදුසු අකුර යොදා හිස්තැන් පුරවන්න.

**(භ, බ, ද, ධ,)**

i ___ය          ය___

ii ___න          න___